සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Department of Education, Southern Province**

| 23 | S | I |
|---|---|---|

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය – දෙවන වාර පරීක්ෂණය – 2019 මාර්තු**

கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்

**General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019**

**13 ශ්‍රේණිය**
**Grade 13**

**දේශපාලන විද්‍යාව – I**
**Political Science - I**

**පැය දෙකයි**
**Two hours**

**සැලකිය යුතුයි :**

- **මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර A කොටස බහුවරණ ප්‍රශ්න 30 කින් සහ B කොටස කෙටි ප්‍රශ්න 20 කින් යුක්ත වේ.**
- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.**
- **එක් පිළිතුරකට ලකුණු දෙක බැගින් මුළු ලකුණු 100 කි.**

## A කොටස

■ **අංක 1 සිට 15 දක්වා ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි හෝ ගැළපෙන පිළිතුර තෝරන්න.**

(01) දේශපාලනය ශාස්ත්‍රීය ලෙස හැදෑරීම යන්නට අදාළ වන්නේ,

1. විද්‍යාත්මකව කරනු ලබන අධ්‍යයනය කිරීමකි.
2. මෙය දේශපාලන විද්‍යාව හා සම්බන්ධ ක්‍රියාවලියකි.
3. මෙහි දී ලබාගන්නා නිගමන සඳහා පෞද්ගලික රුචි අරුචිකම් දැඩි ලෙස බලපායි.
4. මේ තුළින් ලබන දැනුම බුද්ධිය සමාජයේ පිළිගැනීමට ලක් වේ.
5. අවසන් නිගමනවලට එළඹෙන්නේ හැඟීම් හා ආවේග මත නොවේ. (............)

(02) දේශපාලන විද්‍යාව යන්නට දිය හැකි වඩාත් නිවැරදි විග්‍රහය වන්නේ,

1. සමාජයේ පවතින දේශපාලන පැතිකඩ ශාස්ත්‍රීය ලෙස හදාරණ ශික්ෂණයයි.
2. ආණ්ඩු බලය අල්ලා ගැනීමේ ක්‍රමවේදයයි.
3. රාජ්‍ය පාලනය ගෙන යන කලාවයි.
4. මිනිසාගේ අධ්‍යාත්මික දියුණුව උදා කරන්නා වේ.
5. සමාජ බලය හසුරවන විද්‍යාව වේ. (............)

(03) දේශපාලනය ශාස්ත්‍රීය ලෙස හැදෑරීම ආරම්භ වන්නේ,

1. ක්‍රි:පූ: 4 වන සියවසේ දී පමණ ග්‍රීසියේ දී
2. ක්‍රි:පූ: 6 වන සියවසේ දී පමණ ග්‍රීසියේ දී
3. ක්‍රි:පූ: 4 වන සියවසේ දී පමණ රෝමයේ දී
4. ක්‍රි:පූ: 3 වන සියවසේ දී පමණ රෝමයේ දී
5. ක්‍රි:පූ: 19 වන සියවසේ දී පමණ ආසියාවේ දී (............)

(04) දේශපාලන විද්‍යාව සමාජීය විද්‍යාවක් වන්නේ,

1. ලෝක ස්වභාවය අධ්‍යයනය කරන නිසා
2. මිනිසා සහ මිනිසාගේ සමාජ හැසිරීම් සම්බන්ධ දේශපාලන පැතිකඩ අධ්‍යයනය කරන නිසා
3. ග්‍රීක යුගයෙන් ආරම්භ වන නිසා
4. දේශපාලන විද්‍යාව තුළ ඇති ශුද්ධ විද්‍යා ලක්ෂණ නිසා
5. ශුද්ධ විද්‍යාවන් සමඟ සම්බන්ධතා දක්වන නිසා (............)

(05) දේශපාලනය පාලන චර්යාව යන්නට අදාළ වන්නේ,

1. දේශපාලන මතවාදයකි.
2. නූතන රාජ්‍යයක සාමාජිකයන් දේශපාලන සංසිද්ධි අරභයා දක්වන ප්‍රතිචාරයයි.
3. දේශපාලන බලය ක්‍රියාවට නංවන ආකාරයයි.
4. පුරවැසියන් හා සම්බන්ධ ක්‍රියාවලියක් නොවේ.
5. දේශපාලන ක්‍රියාවලියට සම්බන්ධ නොවන්නකි. (............)

(06) දේශපාලන මතවාදවල කාර්යය වන්නේ,

1. ජනතා අභිලාෂයන්ගෙන් ඉවත්ව කටයුතු කිරීමට ආණ්ඩුවට ඉඩ සැලසීමයි.
2. මැතිවරණ ක්‍රියාවලියෙන් ස්වාධීනව සිටීමට මහජනතාවට අනුබල දීමයි.
3. යම් දේශපාලන අදහසක් හා දැක්මක් වඩා ජනතාව ඒකරාශී කිරීමයි.
4. පුරවැසියන්ට තාර්කික ඥාණය සැපයීමයි.
5. ආගම් ප්‍රවර්ධනය කිරීමයි. (............)

(07) රාජ්‍යය යනු,

1. ආණ්ඩුව යන්නට පර්යාය පදයකි.
2. පුරවැසියන්ගෙන් වියුක්ත සමාජ ආයතනයකි.
3. දීර්ඝ ඉතිහාසයක් නොමැති සමාජ ප්‍රපංචයකි.
4. ගෝලීයකරණයෙන් ශක්තිමත් වී ඇති දේශපාලන සංස්ථාවකි.
5. සමාජයේ පවත්නා දේශපාලන බල ආයතනවල ඓක්‍යයයි. (............)

(08) ආණ්ඩුව යනු,

1. රාජ්‍යයෙන් පිටත පවතින දේශපාලන සංස්ථාවකි.
2. සමාජයක පවතින උත්තරීතරම දේශපාලන ආයතනයයි.
3. සීමිත කාලයකට තෝරා පත් කරගනු ලබන්නකි.
4. විධායකයකින් තොරව පැවතිය හැකි ආයතනයකි.
5. අඛණ්ඩ පැවැත්මක් සහිත බල ව්‍යුහයකි. (............)

(09) මාක්ස්වාදයට අනුව,

1. රාජ්‍යය පන්ති ආධිපත්‍යයේ උපකරණයකි.
2. ලිබරල්වාදය සමාජ ප්‍රගමනයට තුඩු දෙන දර්ශනයකි.
3. ධනවාදී ආර්ථික ක්‍රමය හොඳම ආර්ථික ක්‍රමයයි.
4. පන්ති විභේදනය සමාජයේ පොදු යහපතට අවශ්‍ය ය.
5. නිර්ධන පන්ති විප්ලවයට විසඳුම සුභසාධනවාදී රාජ්‍යයයි. (............)

e තක්සලාව TM The National e-Learning Portal for The General Education

(10) දේශපාලන විද්‍යා අධ්‍යයන ප්‍රවේශයක් ලෙස ස්ත්‍රීවාදය වැදගත් වන්නේ,

1. රාජ්‍යය පිළිබඳ එයටම ආවේණික වූ න්‍යායක් නැති නිසා ය.
2. එහි විවිධ ගුරුකුල තිබෙන නිසා ය.
3. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සඳහා අරගල කිරීම අවධාරණය කරන නිසා ය.
4. දේශපාලනය පිළිබඳ අතිමූලික ප්‍රශ්න මතු කරමින්, 'දේශපාලනය' යන සංකල්පය පුළුල් කළ නිසා ය.
5. එයට දිගු ඉතිහාසයක් ඇති නිසාය. (............)

(11) ෆැසිස්ට්වාදී රාජ්‍ය මාදිලිය සම්බන්ධයෙන් අදාළ වන්නේ,

1. පුරවැසියා උත්තරීතර වෙයි.
2. මිනිස් නිදහස උපරිමයෙන් ආරක්ෂා කරයි.
3. ජාතිවාදය උග්‍ර අයුරින් ක්‍රියාත්මක වේ.
4. නිතරම සාමකාමී වාතාවරණයක් ඇති කරයි.
5. මාධ්‍ය නිදහස උපරිමයෙන් භුක්ති විඳියි. (............)

(12) අවම රාජ්‍ය සම්බන්ධයෙන් අදාල වන්නේ,

1. රාජ්‍ය සුභසාධන කටයුතුවල උපරිම ලෙස නිරත වේ.
2. රාජ්‍යයේ කාර්යභාරය සීමා කෙරෙයි.
3. රාජ්‍ය ආර්ථික කටයුතුවලට ප්‍රබලව මැදිහත් වේ.
4. රාජ්‍ය විසින් අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ගණන් තීරණය කරයි.
5. ආර්ථිකය සැලසුම් කිරීමට මධ්‍යගත සැලසුම් මණ්ඩලයන් ඇත. (............)

(13) සමාජ සම්මුතිවාදය සම්බන්ධයෙන් අදාළ වන්නේ,

1. එය සම්මුතියක ප්‍රතිඵලයක් නොවේ.
2. තෝමස් හොබ්ස්, ලොක් හා රූසෝ විසින් ඉදිරිපත් කරන ලදී.
3. දේව වරම් වාදය මෙමගින් වර්ධනය විය.
4. අඥාදායක පාලන ක්‍රමයක් ගොඩනැගීමට රූසෝට අවශ්‍ය විය.
5. ජෝන් ලොක් එංගන්තයේ රාජාණ්ඩුවේ බලය වර්ධනය කිරීමට යෝජනා කරන ලදී. (............)

(14) යටත් විජිත රාජ්‍ය සම්බන්ධයෙන් අදාළ වන්නේ,

1. ඒ ඒ රාජ්‍යයන්ගේ ස්වාධීනභාවය අගය කරයි.
2. එම රටවල්වල ඇති සම්පත් එම රටේ සංවර්ධනය සඳහා යොදා ගන්නා ලදී.
3. එම රටවල්වල ජනතාවට ''යටත් වැසියා'' යන පුරවැසිභාවය දෙන ලදී.
4. රාජ්‍ය පාලනය කළේ ස්වදේශිකයන් විසිනි.
5. අධිරාජ්‍යවාදයක් කිසිවිට ගොඩනැගුණේ නැත. (............)

(15) ''පුරවැසියා'' හා රාජ්‍ය අතර සම්බන්ධයට අදාළ වන්නේ,

1. පුරවැසියා රාජ්‍යයට අවනතභාවය දක්වයි.
2. පුරවැසියාට අයිතිවාසිකම් අවශ්‍ය නොමැත.
3. පුරවැසියාට රාජ්‍ය වෙනුවෙන් යුතුකම් නැත.
4. පුරවැසියා රාජ්‍යයට බදු ගෙවීම ප්‍රතික්ෂේප කළ යුතුය.
5. පුරවැසි නිදහස රාජ්‍ය විසින් පාලනය කළ යුතු ය. (............)

■ **අංක 16 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාළව ප්‍රකාශ පහක් දක්වා ඇත. එම ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ ප්‍රකාශ හතරක් පමණි. නිවැරදි ප්‍රකාශය තෝරන්න.**

(16) සමූහාණ්ඩුව යනු,

A) රාජාණ්ඩුවාදයට එකහෙලා විරුද්ධ විය.
B) පරමාධිපත්‍ය බලයේ හිමිකරුවා මහජනතාව විය.
C) රාජ්‍යයේ නායකයා මහජන ඡන්දයෙන් පත්කර ගත යුතුය.
D) කම්කරු පන්තියේ ශ්‍රම සූරාකෑම මත ගොඩනැගුණක් විය.
E) සෑම පුරවැසියෙකුගේ ම පොදු යහපත අපේක්ෂා කරන්නක් විය.

1. ABCD  2. BCDE  3. ABDE
4. ACDE  5. ABCE  (............)

(17) ඒකීය රාජ්‍ය සම්බන්ධයෙන් අදාළ වන්නේ,

A) ස්වාධිපත්‍ය මුළුමනින්ම රැඳී ඇත්තේ පරිපාලන ආණ්ඩු වෙතය.
B) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ම උත්තරීතරභාවය මධ්‍යයට පවරා ඇත.
C) මධ්‍යයට කැමති පරිදි පළාත් ආණ්ඩු සකසා ගනු ලබයි.
D) දැඩි ජනවාර්ගික බෙදීම්වලින් තොර රටවල් හා කුඩා රටවල් වලට මෙය ගැළපේ.
E) මෙය කාර්යක්ෂමතාව අතින් ඉතා ඉහළය.

1. ABCD  2. BCDE  3. ABDE
4. ACDE  5. ABCE  (............)

(18) සංඝීය රාජ්‍ය සම්බන්ධයෙන් අදාළ වන්නේ,

A) මධ්‍යය හා පරිධිය අතර ස්වාධිපති බලය බෙදා හරියි.
B) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ම බලය බෙදා හරියි.
C) භූමි ප්‍රමාණය විශාල රාජ්‍යයන්ට වඩාත් යෝග්‍ය වේ.
D) මුළුමනින්ම මධ්‍යම ආණ්ඩුව විසින් ප්‍රාන්ත ආණ්ඩු යටත් කරයි.
E) සංඝීය බලතල ක්‍රියාත්මක වීම රාජ්‍යයෙන් රාජ්‍යයට වෙනස් වේ.

1. ABCD  2. BCDE  3. ABDE
4. ACDE  5. ABCE  (............)

(19) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් සම්බන්ධයෙන් අදාළ වන්නේ,

A) පාර්ලිමේන්තුවේ සහය මත ආණ්ඩුවේ කාලය තීරණය වේ.
B) නාමික විධායකය විසින් සත්‍ය විධායකය තෝරා පත් කරයි.
C) සත්‍ය විධායකයේ උපදෙස් පිළිපැදීමට නාමික විධායකයට සිදුවේ.
D) රාජ්‍ය නායකයා ඍජු මහජන ඡන්දයෙන් තෝරා පත් කරයි.
E) අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලයකින් සමන්විත වේ.

1. ABCD  2. BCDE  3. ABDE
4. ACDE  5. ABCE  (............)

(20) ජනාධිපති ආණ්ඩුක්‍රමය සම්බන්ධයෙන් අදාළ වන්නේ,

A) විධායකය ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී සිටී.

B) රාජ්‍ය නායකයා මෙන් ම ආණ්ඩුවේ නායකයා ද ජනාධිපති භූමිකාව නතු කරයි.

C) විධායක බලය වර්ධනය වීම තුළ ආඥාදායකත්වය වර්ධනය විය හැක.

D) කැබිනට් මණ්ඩලය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්නේ ජනාධිපතිගේ නියෝගයන් ය.

E) විධායකය ඉවත් කළ හැක්කේ දෝෂාභියෝගයකින් පමණි.

1. ABCD 2. BCDE 3. ABDE

4. ACDE 5. ABCE (...........)

■ **අංක 21 සිට 30 දක්වා ප්‍රශ්න සඳහා ඒ ඒ මාතෘකාව හා සම්බන්ධව ප්‍රකාශ පහක් ඉදිරිපත් කොට ඇත. ඒවායින් නිවැරදි වන්නේ ප්‍රකාශ හතරක් පමණි. නිවැරදි ප්‍රකාශ අන්තර්ගත කාණ්ඩය තෝරන්න.**

(21) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ආණ්ඩුකාරවරයා,

A) බ්‍රිතාන්‍ය කිරීටයේ සහ බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ නියෝජිතයා විය.

B) අමාත්‍ය මණ්ඩලයේ නායකයා විය.

C) ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන විධායකයා විය.

D) යටත් විජිතය තුළ අධිරාජ්‍යයේ ආශාවන් ආරක්ෂා කිරීමේ ප්‍රධානියා විය.

E) සෑම පනතකටම අවසාන අනුමැතිය දීමේ බල අධිකාරිය ඉසිලීය.

1. ABCD 2. BCDE 3. ABDE

4. ACDE 5. ABCE (...........)

(22) 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණ,

A) අග්‍රාණ්ඩුකාරවරයා සහ කැබිනට් අමාත්‍යවරුන්ගෙන් සමන්විත විධායකය ආණ්ඩුව

B) අග්‍රාණ්ඩුකාරවරයා ද, සෙනෙට් මණ්ඩලය සහ මහජන මන්ත්‍රී මණ්ඩලය යන නම්වලින් හැඳින් වූ ද්විත්ව මණ්ඩලයෙන් ද සමන්විත ව්‍යවස්ථාදායකය

C) අග්‍රාණ්ඩුකාරවරයා ව්‍යවස්ථාදායකයට වගකිව යුතු වීම.

D) ස්වාධීන රාජ්‍ය සේවාවක් පවත්වාගෙන යාම සහතික කිරීම උදෙසා ස්ථාපිත කළ රාජ්‍ය සේවා කොමිසම

E) ශ්‍රේෂ්ඨාධිකරණයේ නායකත්වයෙන් යුත් ස්වාධීන අධිකරණය

1. ABCD 2. BCDE 3. ABDE

4. ACDE 5. ABCE (...........)

(23) 1972 ආණ්ඩුව ව්‍යවස්ථාවේ ප්‍රධාන අංග ලක්ෂණ

A) වෙස්ට්මිනිස්ටර් ආකෘතියෙන් පූර්ණ ලෙස බිඳීයාම සනිටුහන් කළේ ය.

B) ශ්‍රී ලංකාව දේශපාලන වශයෙන් ස්වාධීන ස්වෛරී ජනරජයක් බවට පත් කළේ ය.

C) පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය හරහා ශ්‍රී ලංකාව සමාජ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් බවට පරිවර්තනය කිරීම ඉලක්ක කර ගත්තේ ය.

D) අධිකරණයේ සහ රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය අවප්‍රමාණය කළේ ය.

E) ශ්‍රී ලංකා රාජ්‍යයේ අනාගාමික ස්වරූපය වෙනස් කළේ ය.

1. ABCD 2. BCDE 3. ABDE

4. ACDE 5. ABCE (...........)

(24) 1972 ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ ව්‍යවස්ථාදායකය,

A) ඒක මණ්ඩල වූ අතර ජාතික රාජ්‍ය සභාව නමින් හැඳින්විනි.

B) ජනතාවගේ ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ බලය ක්‍රියාවට නැංවිය.

C) ජනතා පරමාධිපත්‍ය ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් නීතිමය සීමාවන් නොවීය.

D) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට හෝ පරිච්ජින්න කිරීමට හැකි උත්තරීතර ව්‍යවස්ථාදායක බලය භුක්ති වින්දේ ය.

E) ජනතාව විසින් තෝරා පත් කළ නියෝජිතයින් 225 කින් සමන්විත විය.

| | | |
|---|---|---|
| 1. ABCD | 2. BCDE | 3. ABDE |
| 4. ACDE | 5. ABCE | (............) |

(25) 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ ජාතික රාජ්‍ය සභාව,

A) ඒක මාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් විය.

B) ජනතාව විසින් තෝරා පත් කර ගත් නියෝජිතයින්ගෙන් පමණක් සමන්විත විය.

C) පාර්ලිමේන්තු ස්වාධිපත්‍ය මූලධර්ම මත ස්ථාපිත කෙරිණි.

D) බලය සහ තත්ත්වය අතින් සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පැවති පාර්ලිමේන්තුවට බෙහෙවින්ම සමාන විය.

E) ව්‍යවස්ථාවෙන් දක්වා තිබු සය වසරක නිල කාලය භුක්ති විඳීමේ හිමිකම පවරා තිබුණි.

| | | |
|---|---|---|
| 1. ABCD | 2. BCDE | 3. ABDE |
| 4. ACDE | 5. ABCE | (............) |

(26) 2001 දී සිදු කළ 17 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක් කළ මූලික වෙනස්කම්,

A) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ස්ථාපිත කිරීම

B) රාජ්‍ය සේවා සහ අධිකරණ සේවා කොමිෂන් සභාවලට අමතර බලතල පැවරීම.

C) පරිපාලන අභියාචනා විනිශ්චය සභාව හඳුන්වා දීම.

D) ජාතික පොලිස් කොමිසම සහ මැතිවරණ කොමිසම ස්ථාපිත කිරීම.

E) පාර්ලිමේන්තුව විසුරුවා හැරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා ක්‍රියාත්මක කළ සියලු බලතල අහෝසි කිරීම.

| | | |
|---|---|---|
| 1. ABCD | 2. BCDE | 3. ABDE |
| 4. ACDE | 5. ABCE | (............) |

(27) 2010 දී ක්‍රියාවට නැගු 18 වන සංශෝධනය යටතේ, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කළ වෙනස්කම්,

A) පරිපාලනය සඳහා වූ පාර්ලිමේන්තු කොමසාරිස් ධූරය අහෝසි කිරීම

B) එක් පුද්ගලයකුට ජනාධිපති තනතුරට තේරීපත් විය හැකි වාර දෙකේ සීමාව ඉවත් කිරීම.

C) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අවලංගු කොට පාර්ලිමේන්තු සභාව ස්ථාපිත කිරීම.

D) රාජ්‍ය සේවා, පොලිස් සහ මැතිවරණ කොමිෂන් සභාවලට පැවරී තිබූ සමහර බලතල සීමා කිරීම

E) ජනාධිපතිවරයාට සෑම මාස තුනකට වරක් පාර්ලිමේන්තුවට පැමිණීමට හැකි වන ලෙස විධිවිධාන සැකසීම.

| | | |
|---|---|---|
| 1. ABCD | 2. BCDE | 3. ABDE |
| 4. ACDE | 5. ABCE | (............) |

(28) 2015 දී සිදු කළ 19 වන සංශෝධනය යටතේ, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක් කළ මූලික වෙනස්කම් කිහිපයක්,

A) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ප්‍රතිෂ්ඨාපනය කිරීම.

B) ජනාධිපති තනතුර දැරීම සම්බන්ධ වාර දෙකේ කොන්දේසි නැවත පැනවීම.

C) ජනාධිපති තනතුරේ නිල කාලය වසර හයේ සිට වසර පහ දක්වා අඩු කිරීම.

D) පාර්ලිමේන්තුවේ නිලකාලය වසර හයේ සිට වසර පහ දක්වා අඩු කිරීම.

E) පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට හිමි පූර්ව අධිකරණ නිරීක්ෂණ බලය ඉවත් කිරීම.

1. ABCD 2. BCDE 3. ABDE

4. ACDE 5. ABCE (............)

(29) එක්සත් ජාතීන්ගේ සංවිධානය,

A) වර්තමාන ලෝකය තුළ පවතින විශාල ම අන්තර් රාජ්‍ය සංවිධානය වේ.

B) මහ බලවතුන් පස් දෙනාගෙන් සැදුම්ලත් කමිටුවක් මගින් පාලනය කෙරේ.

C) ප්‍රධාන ආයතන හයකින් සමන්විත වේ.

D) ලෝක සාමය සහ සුරක්ෂිතභාව පවත්වා ගෙනයාමේ වගකීම් දරන ප්‍රධාන අන්තර්ජාතික රාජ්‍ය සංවිධානය වේ.

E) ක්‍රියා කරන්නේ සමාජික රාජ්‍යයන්ගේ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් නොවීමේ ප්‍රතිපත්තිය මතය.

1. ABCD 2. BCDE 3. ABDE

4. ACDE 5. ABCE (............)

(30) කලාපීය සහයෝගීතාව සඳහා වූ දකුණු ආසියාතික සංවිධානය

A) රාජ්‍ය නොවන සංවිධානයක් වේ.

B) දකුණු ආසියාතික රාජ්‍යයන් අටකින් සමන්විත වේ.

C) කලාපීය ආර්ථික හා සමාජීය සහයෝගීතාව වර්ධනය කිරීම ගැන සැළකිලිමත් වේ.

D) පිහිටුවා තිබෙන්නේ 1985 ඪකා ප්‍රකාශනයේ අන්තර්ගත මූලධර්ම පදනම් කරගෙනය.

E) අන්තර්ජාතික සමාජයේ ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ ''දුප්පතුන්ගේ සමාජය'' ලෙසය.

1. ABCD 2. BCDE 3. ABDE

4. ACDE 5. ABCE (............)

## B කොටස

■ **කෙටි පිළිතුරු සපයන්න.**

(31) දේශපාලන විද්‍යාවේ පියා සහ දේශපාලන විද්‍යාවේ ඇපකාර පියා වශයෙන් හඳුන්වනු ලබන චින්තකයින් දෙදෙනා නම් කරන්න.

1. ..........................................................................................................

2. ..........................................................................................................

(32) පහත සඳහන් ග්‍රන්ථ රචනා කරන ලද කතුවරුන් නම් කරන්න.

1. යුක්තිය පිළිබඳ න්‍යායන් (A Theory of Justice) - ..........................................................................................................
2. සමූහාණ්ඩුව (Republic) - ..........................................................................................................

(33) දේශපාලන විද්‍යා අධ්‍යයන ප්‍රවේශ දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................................

2. ..........................................................................................................

(34) දේශපාලන මතවාද දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................................

2. ..........................................................................................................

(35) දේශපාලන පක්ෂ ක්‍රම දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................................

2. ..........................................................................................................

(36) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක මූලික ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................................

2. ..........................................................................................................

(37) සමාජ සම්මුතිවාදීන් දෙදෙනෙකු නම් කරන්න.

1. ..........................................................................................................

2. ..........................................................................................................

(38) ලිබරල්වාදය ප්‍රධාන ප්‍රභේද තුනක් ඔස්සේ හඳුනාගත හැකිය. ඉන් දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................................

2. ..........................................................................................................

(39) ස්ත්‍රීවාදය තුළ දක්නට ලැබෙන ප්‍රධාන ධාරාවන් දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

(40) ගැටුම් සමථන ක්‍රියාවලියේ දී ප්‍රයෝජනයට ගන්නා මූලික මාධ්‍ය දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

(41) 1833 කෝල්බෲක් කොමිෂන් නිර්දේශ දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

(42) ප්‍රථම වරට සීමිත ඡන්ද බලය සහ නිල නොලත් සභික සංඛ්‍යාව වර්ධනය කළ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ දෙක නම් කරන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

(43) 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය තුළින් සර්වජන ඡන්ද බලය ප්‍රදානය කළේ ය. ඒ කෙරෙහි බලපෑ හේතු සාධක දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

(44) 1931 විධායක කාරක සභා ක්‍රමයෙහි යහපත් ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

(45) 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට යොදා තිබූ ආරක්ෂණ විධිවිධාන දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

(46) 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සෙනෙට් සභාව මන්ත්‍රීවරු දෙවර්ගයකින් සමන්විත විය. එම සංඛ්‍යාව හා වර්ග දෙක සඳහන් කරන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

The National e-learning Portal for The General Education

(47) 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ හඳුන්වා දෙනු ලැබූ නවාංග දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

(48) 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ හඳුන්වා දෙනු ලැබූ ව්‍යවස්ථාදායකය හඳුන්වනු ලබන නිල නාමය සහ නිල කාලය කොපමණ ද?

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

(49) 17 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ පිහිටවනු ලැබූ කොමිෂන් සභා දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

(50) 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාවේ 19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපති ධූරය සම්බන්ධයෙන් කරනු ලැබූ වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

The National e-learning Portal for The General Education

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Department of Education, Southern Province**

| 23 | S | I |
|---|---|---|

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය – දෙවන වාර පරීක්ෂණය – 2019 මාර්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்**
**General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019**

| 13 ශ්‍රේණිය<br>Grade 13 | දේශපාලන විද්‍යාව – II<br>Political Science - II | පැය තුනයි<br>Three hours |
|---|---|---|

**සැලකිය යුතුයි :**

- **මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විතය.**
- **පළමුවැනි කොටසින් යටත් පිරිසෙයින් එක් ප්‍රශ්නයක් ද, දෙවැනි කොටසින් යටත් පිරිසෙයින් ප්‍රශ්න දෙකක් ද, තුන්වෙනි කොටසින් යටත් පිරිසෙයින් එක් ප්‍රශ්නයක් ද වන සේ තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

## I කොටස

(01) දේශපාලනය හා දේශපාලන විද්‍යාව අතර ඇති සම්බන්ධය කෙබඳු දැයි සාකච්ඡා කරන්න.

(02) දේශපාලනය අධ්‍යයනය කිරීම සඳහා ඇති ඕනෑම ප්‍රවේශ මාර්ග දෙකක් විස්තර කරන්න.

(03) පහත සඳහන් මාතෘකාවලින් ඕනෑම දෙකක් සාකච්ඡා කරන්න.

i. ජාතික රාජ්‍යයක අත්‍යාවශ්‍ය අංග ලක්ෂණ
ii. අවම රාජ්‍යයක ලක්ෂණ
iii. පැසිස්ට්වාදී රාජ්‍යයක මූලික අංග ලක්ෂණ
iv. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ප්‍රධාන අංග ලක්ෂණ
v. ස්ත්‍රීවාදය

## II කොටස

(02) 1833 කෝල්බෘක් - කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ සමාජ, ආර්ථික, දේශපාලන ප්‍රතිඵල කෙටියෙන් විස්තර කරන්න.

(05) 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ විධායක කාරක සභා ක්‍රමයේ යහපත් ලක්ෂණ හා අයහපත් ලක්ෂණ සාකච්ඡා කරන්න.

(06) සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ හඳුන්වා දෙනු ලැබූ නාමික විධායකය සහ 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ හඳුන්වා දෙනු ලැබූ නාමික විධායකය සසඳන්න.

(07) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය යටතේ ජනාධිපතිවරයා සතු බලතල සසඳන්න.

## III කොටස

(08) ඇමරිකාවේ හෝ ඉන්දියාවේ සංධීය ක්‍රමය පිළිබඳ සාකච්ඡා කරන්න.

(09) පහත සඳහන් මාතෘකාවලින් ඕනෑම දෙකක් කෙටියෙන් ලියන්න.

i. ගැටුම් වර්ගීකරණය

ii. ගැටුම්වල සාධනීය හා නිශේධනීය පැතිකඩ

iii. ගැටුම් සමථනය

iv. සාමය ගොඩනැගීම හා ප්‍රතිසංධාන ගත වීම

(10) අන්තර්ජාතික දේශපාලනයේ ක්‍රියාධරයින් හා ඔවුන්ගේ ක්‍රියාකලාපය පිළිබඳව කෙටි විවරණයක් සපයන්න.

The National e-learning Portal for The General Education

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු

13 ශ්‍රේණිය **දේශපාලන විද්‍යාව** විසඳුම් පත්‍රය

## I - පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01.2 | 02.1 | 03.1 | 04.2 | 05.2 | 06.3 | 07.5 | 08.2 | 09.1 | 10.3 |
| 11.3 | 12.2 | 13.2 | 14.3 | 15.1 | 16.5 | 17.2 | 18.5 | 19.5 | 20.2 |
| 21.4 | 22.3 | 23.2 | 24.1 | 25.5 | 26.1 | 27.2 | 28.1 | 29.4 | 30.2 |

### B කොටස

31. 1. ඇරිස්ටෝටල් 2. සොක්‍රටීස්

32. 1. ජෝන් රෝල්ස් 3. ප්ලේටෝ

33. 1. දාර්ශනික / ප්‍රතිමානීය ප්‍රවේශය
තුලනාත්මක ප්‍රවේශය
2. බහු විෂයක ප්‍රවේශය
සමාජ විද්‍යාත්මක ප්‍රවේශය

34. 1. සමාජවාදය / ස්ත්‍රීවාදය 2. ලිබරල්වාදය / සමූහාණ්ඩුවාදය

35. 1. තනි පක්ෂ ක්‍රම
ද්වි පක්ෂ ක්‍රම
2. බහු පක්ෂ ක්‍රම
අධිපති ද්වි පක්ෂ ක්‍රම

36. 1. නිදහස් මැතිවරණය
අධිකරණයේ ස්වාධීනත්වය
2. නීතියේ ආධිපත්‍යය
ව්‍යවස්ථානුකූල වාදය

37. 1. තෝමස් හොබ්ස් 2. ජෝන් ලොක් ජීන් ජැක්වින් රූසෝ

38. 1. නිර්බාධවාදය 2. සුබසාධන වාදය අවම රාජ්‍ය

39. 1. ලිබරල් ස්ත්‍රීවාදය
සමාජවාදී ස්ත්‍රීවාදය
2. රැඩිකල් ස්ත්‍රීවාදය
පශ්චාත් නූතන ස්ත්‍රීවාදය

40. 1. සහමන්ත්‍රණය
මැදිහත්කරණය
2. සාම ගිවිසුම්
සාමය ගොඩනැගීම

41. 1. උඩරට හා පහතරට ප්‍රදේශ ඒකාබද්ධ කිරීම
පළාත් 16 පහක් දක්වා අඩු කිරීම
2. රාජකාරි ක්‍රමය අහෝසි කිරීම
විධායක හා ව්‍යවස්ථාදායක සභා පිහිටුවීම

42. 1. 1910 - කෲව් - මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
    2. 1920 - මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

43. 1. ගම සහ නගරය අතර තිබූ අසම තුලිතතාවය තුරන් කිරීම
    2. හරිජනයින්ගේ සමාජ තත්ත්වය ඉහළ නැංවීම සඳහා

44. 1. රාජ්‍ය සේවය මෙහෙය වීමට පලපුරුද්දක් ලැබීම
    ආණ්ඩුවේ කටයුතුවලට සම්බන්ධ වීමට ලාංකිකයන්ට අවස්ථාවක් උදා වීම.
    2. සුබ සාධක කටයුතු වර්ධනය වීම

45. 1. 29 (II) හා වගන්තිය
    බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාස පිහිටු වීම.
    2. රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් පිහිටු වීම
    අධිකරණ සේවා කොමිෂන් සභාවක් පිහිටු වීම.

46. 1. සුළු ජාතීන් වෙනුවෙන් - මන්ත්‍රීවරු 15 යි
    2. උගත් බුද්ධිමත් පිරිස් වලින් - මන්ත්‍රීවරු 15 යි

47. 1. ජනාධිපතිධූරය
    ව්‍යවස්ථාධිකරණය
    2. මූලික අයිතිවාසිකම්
    ජාතික රාජ්‍ය සභාව

48. 1. ජාතික රාජ්‍ය සභාව
    2. නිල කාලය වසර 06 කි.

49. 1. පොලිස් කොමිෂම
    මානව හිමිකම් කොමිසම
    2. මුදල් කොමිෂම
    අධිකරණ සේවා කොමිසම

50. 1. නිල කාලය වසර 06 සිට 05 දක්වා අඩු කිරීම
    සිය ධූරය දැරිය හැකි වාර ගණන දෙකකට සීමා කිරීම.
    2. මුක්තියේ නිදහස සීමා කිරීම
    නව පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැකි වන්නේ වසර 41/2 ක් ගිය පසුවයි.